# ශ්‍රී ලංකාවේ
# විසම්මුතිය මර්දනය

2015 ජූනි 01 සිට ජූනි 30 දක්වා



මහජන සම්මන්ත්‍රණයකින් ජනමාධ්‍යවේදීන් ඉවත් කිරීමෙන් අනතුරුව යාපනය ලේකම් කාර්යාලයේ දොරටුව පොලීසිය විසින් මුර කළ අයුරු (ඡායාරූපය- Tamil Guardian/ @mayurappriyan)

INFORM Human Rights Documentation Centre
www.ihrdc.wordpress.com informcolombo@gmail.com

# ආවරණය කළ සිදුවීම්

**A. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස**

**B. රැස්වීමේ නිදහස**

*ඉන්ෆෝම්ආයතනය1990දීආරම්භකරන ලද්දේ විශේෂයෙන්ම වාර්ගිකගැටුමසහයුද්ධයසන්දර්භයෙ හිශ්‍රීලංකාවේ මානවහිමිකම්තත්ත්වයනිරීක්ෂණයකරමින්කරුණුගොනුකිරීමටත්එමකරුණුලිඛිතසහවාචිකමැදිහත්වීම්හරහා ප්‍රාදේශීයව,ජාතිකවසහ ජාත්‍යන්තරවවාර්තාකිරීමටත්ය. එසේමසියඅයිතීන් නිරන්තරයෙන්සහක්‍රමවත් කෙලසීමට ලක්වන අනෙක්ජනප්‍රජාවන්සමගද ඉන්ෆෝම්ආයතනයකටයුතුකරයි. වර්තමානයේදී ඉන්ෆෝම්ආයතනයමැතිවරණනිරීක්ෂණය,මාධ්‍ය නිදහසසහමානවහිමිකම්ආරක්ෂකයින් සම්බන්ධයෙන්සියඅවධානයයොමු කරතිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටාඇති ඉන්ෆෝම් ආයතනය දේශීයක්‍රියාධරයින්,කණ්ඩායම්සහජාලයන්සමඟ මෙන්මකලාපීයසහජාතයන්තරමානවහිමිකම්ජාලයන්සමග සහයෝගයෙන් කටයුතු කරයි.*

## සාරාංශය :

2015 වර්ෂයේ ජූනි මාසය තුළද විසම්මුතිය මැඩලීමේ සිදුවීම් කිහිපයක් දිවයිනේ ප්‍රදේශ කිහිපයකින් වාර්තා විය. ඉන් බොහොමයක් වාර්තා වූයේ උතුරු නැගෙනහිර ප්‍රදේශ වලිනි.

නැවත පදිංචි කිරීම් පිළිබඳ සාකච්ඡා කිරීමට යාපනයේ පැවැත්වුණු මහජන සම්මන්ත්‍රණයකින් ජනමාධ්‍යවේදීන්ව ඉවත් කරන ලදී. මුලතිව්හි ආරක්ෂක හමුදා විසින් දැවැන්ත බුදු රුවක් ඉදිකිරීම පිළිබද විරෝධතාවයක නිරත වූ ගම් වැසියන්ව අත්අඩංගුවට ගෙන පැය කිහිපයක් රුඳවුම්භාරයේ තබා ඇත. රැස්වීමේ නිදහසට අදාළව නිරීක්ෂණය කිරීමේ සහ බිය ගැන්වීමේ සිදුවීම් කිහිපයක් මඩකළපුව සහ නැගෙනහිර සෙසු පළාත් වලින් වාර්තා විය. කාන්තාවන්ට සහ ළමුන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය පිටු දැකීම් සඳහා පැවති විරෝධතාවකට සම්බන්ධවූවන්ට සහ එයට සහයෝගය පළ කළ පුද්ගලයන්ට, විරෝධතාවයට පෙර, එය පැවැත්වෙන අවස්ථාවේදී මෙන්ම ඉන් පසුවත් බිය ගැන්වීම් එල්ල විය.

ඉන්ෆෝම් ආයතනයේ මානව හිමිකම් පිළිබඳ උපදේශක රුකී ප්‍රනාන්දු සම්බන්ධයෙන් කෙරෙන පරීක්ෂණය අවසන් කිරීම ත්‍රස්ත විමර්ශන ඒකකය සහ නීති පති දෙපාර්තමේන්තුව විසින් තව දුරටත් ප්‍රතික්ෂේප කළේය. මාස 15කට පෙර ඔහු වෙත පනවන ලද විදේශ ගතවීම් පිළිබඳ වූ සීමා 2015 ජූනි 30 වන දින ඉවත් කළ නමුත් අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳව පනවා ඇති සීමා නියෝගය ඉවත් කිරීම සහ රජය භාරයට ගත් ඔහුගේ සන්නිවේදන උපකරණ නැවත භාර දීම ප්‍රතික්ෂේප කරන ලදී.

පසුගිය වර්ෂ හා සසඳන විට 2015 ජූනි මාසයේ විසම්මුතිය මර්දනය කිරීමේ සිදුවීම් වල තීව්‍රතාවය සහ සිදුවීම් ගණන පහළ ගොස් ඇති බව පෙනෙන්නට තිබේ. කෙසේ වෙතත් පසුගිය කාලයේ සිදුවීම්වලට අදාළ වැරදිකරුවන් දඬුවම් නොලබා සිටීම කණගාටුවට කරුණකි.

## A. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

### 1. නැවත පදිංචි කිරීම පිළිබඳ යාපනයේදී පැවති මහජන සම්මන්ත්‍රණයෙන් ජනමාධ්‍යවේදීන් ඉවතට

අමාත්‍ය ඩී.එම්.ස්වාමිනාදන් මහතා සමග නැවත පදිංචි කිරීම පිළිබඳ පැවති මහජන සම්මන්ත්‍රණයට ආරාධනා ලැබූ ජනමාධ්‍යවේදීන්ව රජයේ නියෝජිතයෙකුගේ නියෝගය පරිදි සාකච්ඡාව ආරම්භ වීමට පෙර එම ස්ථානයෙන් ඉවත් කළ බව වාර්තා විය. නැවත පදිංචි වීමට අපේක්ෂාවෙන් සිටින හෝ නැවත පදිංචි වීමේ අවශ්‍යතාවය ඇති පුද්ගලයන්ගේ අදහස් විමසීමට මෙම සම්මන්ත්‍රණය පැවැත්වෙන බව ස්වාමිනාදන් මහතා පැවසුවේ ඔහුගේ සේවක මණ්ඩලයේ සාමාජිකයෙකු ජනමාධ්‍යවේදීන්ට ඉවත්ව යන ලෙස නියෝග කිරීමෙන් පසුවයි. ජනමාධ්‍යවේදීන් ඉවත් කිරීමෙන් අනතුරුව එම ස්ථානයේ දොරවල් වසා පොලිස් ආරක්ෂාව යොදා තිබිණි.

මූලාශ්‍රය-http://www.tamilguardian.com/article.asp?articleid=15179

### 2. රුකී ප්‍රනාන්දු - විදේශගතවීම පිළිබඳව පනවා තිබූ තහනම් ඉවතට, අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳ තහනම් නියෝගය තවදුරටත් බලාත්මක කෙරේ

ශ්‍රී ලංකාවේ මුල් පෙළේ මානව හිමිකම් ආරක්ෂකයෙකු වන රුකී ප්‍රනාන්දු වෙත මාස 15කට පෙර පැනවූ විදේශ ගතවීම පිළිබඳ තහනම් නියෝගය කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2015 ජූනි 30 වන දින ඉවත් කරන ලදී. කෙසේ වුවත් ඔහු පිළිබඳව ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් කරනු ලබන විමර්ශනය සහ අදහස් ප්‍රකාශ කිරීම පිළිබදව වූ තහනම් නියෝගය තවදුරටත් ක්‍රියාත්මක කෙරේ. රජය භාරයට ගත් ඔහුගේ සන්නිවේදන උපකරණ නැවත භාර දී නොමැත. 2014 නොවැම්බර් මාසයේ ඉදිරිපත් කළ ලිඛිත ඉල්ලීමක් හරහා ඔහුගේ නීතිඥවරුන් විසින් නීතිපති දෙපාර්තමේන්තුව සමග මාස ගණනාවක් තිස්සේ කරන ලද සාකච්ඡාවලින් අනතුරුව විදේශ ගත වීම පිළිබද පනවා තිබූ තහනම ඉවත කර ඇත. තහනම පැවැත්වුණු කාලය තුළ විදේශ ගත වීම සඳහා රුකී ප්‍රනාන්දු මහතාට අවසර ලබා දී තිබුණත් අවස්ථා ගණනාවකදීම ආගමන විගමන දෙපාර්තමේන්තුව, ත්‍රස්ත විමර්ශන ඒකකය සහ රාජ්‍ය බුද්ධි අංශ සේවාව විසින් ගුවන්තොටුපළේදී මිනිත්තු 5ත් 45ත් අතර කාලයක් ඔහුව නවත්වා ඇත. මේ නිසා ඔහුට ප්‍රමාදයන් සහ සෙසු මගීන්ගේ නින්දාවන් නිසා ලැජ්ජාවටද පත් වීමට සිදු විය.

මූලාශ්‍රය -http://srilankabrief.org/2015/06/travel-restrictions-removed-an-e-mail-from-ruki-fernando/

## B. රැස්වීමේ නිදහස

### 3. හමුදාව විසින් ඉදි කරන බුදු රුවට විරෝධය පෑ පුද්ගලයන් අත්අඩංගුවට

මුලතිවු දිස්ත්‍රික්කයේ කෝකිලායි හි හමුදාව විසින් අත්පත් කරගෙන ඇති ඉඩමක බෞද්ධ විහාරයක් ඉදි කිරීම සම්බන්ධයෙන් පැවති විරෝධතාවයකින් පසු පොලීසිය විසින් අදාළ ඉඩමේ හිමිකරුව අත්අඩංගුවට ගෙන ඇත.

ඉඩමේ හිමිකරුවන් වන තිරුඥානසම්බන්දාර් මානිවන්නදාස්, කදර්කාමු සිවයෝගේස්වරන් සහ ලෝගනාදන් ජුඩ් නිමලන් යන පුද්ගලයන් විසින් හමුදාව විසින් ඉදි කර ඇති බෞද්ධ විහාරය ඉදිරිපිට සංකේතාත්මක උපවාසයක් පවත්වා ඇත. පොලීසිය විසින් මෙම පිරිස අත්අඩංගුවට ගෙන විරෝධතාවය නවතා දමන ලෙස බල කර ඇත. පැය කිහිපයක් පොලීසියේ රඳවා ගැනීමෙන් අනතුරුව මොවුන්ව නිදහස් කරන ලදී.



පසුගිය සතියේ කෝකිලායි හි ඉදිකරන බෞද්ධ විහාරය භූමියේ හමුදාව සිටින ආකාරය (@uthayarasashali)
මූලාශ්‍රය - http://www.tamilguardian.com/article.asp?articleid=14956

## 4. කාන්තාවන්ට සහ ළමුන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විරෝධතාවයට සම්බන්ධවූවන්ට බිය ගැන්වීම්

2015 ජුනි 01 වන දින දිවයිනේ දිස්ත්‍රික්ක 10 දී පමණ කාන්තාවන්ට සහ ළමුන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විරෝධතා මාලාවක් පැවැත්විණි. දිස්ත්‍රික්ක කිහිපයක එම විරෝධතා සංවිධානය කළ පුද්ගලයන්ට සහ සහභාගීවූවන්ට විරෝධතාවයට පෙර, එය පැවැත්වෙන අතරතුර සහ ඉන් පසුව විවිධ බිය ගැන්වීම්වලට මුහුණ දීමට සිදු විය. ලක් විය. සාමාන්‍ය පොලිස් නිලධාරීන්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ බුද්ධි අංශ නිලධාරීන් විසින් මෙම බියැන්වීම් දියත් කර ඇත. මෙම විරෝධතාවන්ට සම්බන්ධ වන ලෙස ජනතාව ධෛර්යමත් කළ උතුරේ දෙමළ පූජකවරයෙකුට එසේ නොකරන ලෙසට තර්ජනය කර ඇත. උතුරු නැගෙනහිර අවම වශයෙන් මෙම විරෝධතා සංවිධානය කළ පුද්ගලයන්ගේ එක් නිවසකට සහ එක් ආයතනයකට අදාළ නිලධාරීන් පැමිණ ඇත. එමෙන්ම සිවිල් ඇඳුමින් සැරසී සිටි බුද්ධි අංශ නිලධාරියෙකු විසින් උතුරු නැගෙනහිර පැවති සියලුම විරෝධතාවන්ගේ ඡායාරූප ගෙන ඇත. ඒ අතර එක් විරෝධතාවයකදී එහි සංවිධායකයන් කවුරුන් දැයි විමසා තිබුණි.

## 5. මඩකලපුවේ සාමකාමී රැස්වීමකට ආරක්ෂක හමුදාවන්ගෙන් හිරිහැර

'කොළඹින් ලැබෙන නියෝග අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා යුද හමුදාවේ ආරක්ෂක හමුදා නිලධාරීන් විසින් දිස්ත්‍රික්කයේ කොට්ඨාශ 14 තුළම සමාජ, ආර්ථික, සංස්කෘතික සහ ආගමික රැස්වීම්වලට සම්බන්ධ වන පුද්ගලයන් සම්බන්ධයෙන් කෙරෙන නිරීක්ෂණය සහ බිය ගැන්වීම් වැඩි කර ඇත.' යනුවෙන් ටැමිල් නෙට් වෙබ් අඩවිය වාර්තා කළේය. විහාර කළමණාකාර මණ්ඩලයේ සාමාජිකයෙකු උපුටා දක්වමින් "රැස්වීමේ නිදහස ඉතා භායානක ලෙස තර්ජනයට ලක් වී තිබෙනවා. පොදු මහජන රැස්වීම් වලට එන පුද්ගලයන් පවා ප්‍රශ්න කිරීම්වලට බඳුන් වුණා. " යනුවෙන් වාර්තා කළේය. මෑත කාලයේ සිට ග්‍රාම සංවර්ධන සමාජ, කාන්තා ග්‍රාම සංවර්ධන සමිති, ක්‍රීඩා සමාජ, විහාර කළමණාකාර කමිටු යනාදිය ක්‍රමානුකූලව නිරීක්ෂණය කරන බවට තොරතුරු වාර්තා වන බව එම වෙබ් අඩවිය තව දුරටත් වාර්තා කළ අතර "හමුදාව සමග සහයෝගයෙන් කටයුතු කරන ලෙස බල කිරීමට ලක් වූ හිටපු එල්.ටී.ටී.ඊ සාමාජිකයන්ව තොරතුරු එක් රැස් කිරීම සඳහා මෙම රැස්වීම්වලට යවා ඇත." යනුවෙන් වාර්තා කළේය. ශ්‍රී ලංකා යුධ හමුදාවේ බුද්ධි අංශ නිළධාරීන් විසින් රාත්‍රී කාලයේ දී දුරකතන ඇමතුම් ලබා දෙමින් මෙම රැස්වීම් වලට සහභාගී වූ පුද්ලයන්ගෙන් අදාළ රැස්වීම් සහ ඒවාට පැමිණෙන අය පිළිබඳ ප්‍රශ්න අසමින් හිරිහැර කරන බවද එම වාර්තා තවදුරටත් පෙන්වා දුන්නේය.

මුලාශ්‍රය https://www.tamilnet.com/art.html?catid=13&artid=37818